www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ජී8 සමුලුවෙන් පසුව: එක්සත් ජනපදය සහ රුසියාව අතර ගැටුම තියුනු වෙයි

## After G8 summit: Conflict between US and Russia intensifies

**පීටර් ෂ්වාර්ස් විසිනි**
**2007 ජුනි 12**

ජර්මනියේ හෙයිලිජෙන්ඩැම්හි පැවති ජී8 සමුලුවේ දී එම රාජ්‍යයන්හි නායකයන් අතර පවත්නා සබඳතාවන් සුසංවාදී බවට ප්‍රසිද්ධියේ මවා පෑ දසුන පැවතියේ පැය 24කටත් අඩු කාලයකි. ැටුම්, විශේෂයෙන් ම එක්සත් ජනපදය සහ රුසියාව අතර ගැටුම්, යලි වතාවක් පුපුරා යේ සමුලුවට සහභාගි වූවන් සිය නිවෙස් කරා ලඟා වන්නටත් කලිනි.

ලන්ඩනය කරා ආපසු යන සිය ගමනේ දී බ්‍රිතාන්‍ය අගමැති ටෝනි බ්ලෙයාර් ඩර් ස්පීගල් සඟරාවේ පුවත්පත් කලාවේදීන් තිදෙනෙකුට සවිස්තරාත්මක සම්මුඛ සාකච්ඡාවක් ලබා දුන්නේ ය. ඔහු කී පලමු දෙය වූයේ රුසියාව සමග පවතින ගැටුම් තව මත් විසඳී නැති බව යි.

“අන්‍යෝන්‍ය දුෂ්කරතාවන් ජය ගැනීමට අවශ්‍ය කරන අභිලාෂය සැබවින් ම තිබෙනවා. ඒත් පවතින වෙනස්කම් එහෙම ම තිබෙනවා” යි බ්ලෙයාර් කී ය. “විය යුතු පරිදි ම, රුසියාව සමග යහපත් සබඳතා පවත්වා ගැනීම වැදගත්. ඒත් ඒවා යලි ස්ථාපනය කරන්නේ කෙසේ ද යන්න ගැන දැන් යුරෝපය තුල අතිශයින් ම වෙනස් දෘෂ්ටීන් පවතිනවා” යි ද ඔහු තව දුරටත් කී ය.

එක්සත් ජනපදය චෙක් සමූහාන්ඩුව සහ පෝලන්තය තුල මිසයිල ආරක්ෂන පද්ධතියක් පිහිටුවීමේ ක්‍රියාවට පක්ෂව බ්ලෙයාර් විශේෂයෙන් ම පෙනී සිටියේ ය. රුසියාව මෙම සැලසුම් දැඩි ලෙස ප්‍රතික්ෂේප කරන අතර ඒවා සිය ආරක්ෂාවට තර්ජනයක් සේ සලකයි. මිසයිල ආරක්ෂන පද්ධතියක් අසර්බයිජානයෙහි පිහිටුවා රුසියාව සහ එක්සත් ජනපදය එය සහයෝගී ව්‍යාපෘතියක් ලෙස පවත්වා ගෙන යා යුතු ය යන තමන්ගේ ම යෝජනාවක් රුසියානු ජනාධිපති ව්ලැඩිමීර් පුටින් ජී8 සමුලුවේ දී ඉදිරිපත් කලේ ය.

සිකුරාදා සමුලුව අවසන් වීමෙන් කෙටි වේලාවකට පසුව අසල පිහිටි ග්ඩාන්ස්ක්හි වෙසෙන පෝලන්ත ජනාධිපති ලෙක් කසින්ස්කි බැහැ දැකීමට ගිය ජනාධිපති බුෂ්, පෝලන්තය සහ චෙක් සමූහාන්ඩුව තුල මිසයිල ආරක්ෂන පද්ධතියක් පිහිටුවීම පිලිබඳව වූ සිය මුල් සැලැස්මේ ම එක්සත් ජනපදය තව දුරටත් එල්බ සිටින බව සහතික විය.

පෝලන්තයේ සිට රෝමයට පියාසර කල බුෂ් “මගේ ආදරනීය රොමානෝ” (ඉතාලි අගමැති රොමානෝ ප්‍රෝඩි) වෙත මහත් සේ ශුභාසිංසන පල කල අතර, ලෙබනනයෙහි සහ ඇෆ්ඝනිස්ථානයෙහි ඉතාලි මිලිටරිය විහිදුවා හැරීම පිලිබඳව ඔහුට යලි යලිත් තුති පිදී ය. අගමැති තනතුරට පත් වූ වහා ම ප්‍රෝඩි ඉරාකයෙන් ඉතාලි හමුදා ඉවත් කර ගැනීම නිසා වොෂින්ටනය සහ මධ්‍ය-වාම ප්‍රෝඩි ආන්ඩුව අතර සබඳතා ආතතිකර තත්ත්වයට පත් වූයේ මින් වැඩි කලකට ඉහත දී නො වේ. කෙසේ වුව රුසියාව සමග පවතින තීව්‍රත්වයට පත් ගැටුමේ පසුබිම තුල ඉතාලි ආන්ඩුව තම පාර්ශ්වයට දිනා ගැනීම සඳහා බුෂ්ට හේතුවක් පැවතුනි.

ඉරිදා බුෂ් ඇල්බේනියානු අගනුවර වන ටිරානාහි පෙනී සිටියේ ය. එහි දී ඔහු කොසෝවෝවට නිදහස ලබා දෙන බවට ප්‍රීතියෙන් කුල්මත්ව සිටි ජන සමූහයක් ඉදිරියේ පොරොන්දු විය. කොසෝවෝවේ අනාගතය පිලිබඳව “දිගින් දිගට ම පවතින සංවාදයක්” ගැන ඔහු කී විට ඔහුට විරුද්ධත්වය පල විය. එකල්හි ඔහු මෙසේ ප්‍රකාශ කලේ යː “කල් පසු වී නො ව ඉක්මනින් ම මෙසේ කියන්නට වෙනවාː ඇති කියන්නෙ ඇති. කොසෝවෝව නිදහස්.”

ප්‍රධාන වශයෙන් ම ඇල්බේනියානු ජනවාර්ගිකයන් වාසය කරන කොසෝවෝවේ සර්බියානු ප්‍රාන්තය නේටෝවේ මිලිටරි මැදිහත් වීම මගින් 1999 දී සර්බියාවෙන් බලාත්කාරයෙන් වෙන් කරන ලදි. එය වර්තමානයේ දී එක්සත් ජාතීන්ගේ පාලනාධිකාරයක් යටතේ පවතී. ඇල්බේනියානු කොසෝවෝවරුන්ගේ පක්ෂ පූර්ණ නිදහස ඉල්ලා සිටින අතර, සර්බියානු ජාතික භූමි ප්‍රදේශය පවරා දීම පිලිබඳ අදහස සම්බන්ධයෙන් බෙල්ග්‍රේඩය දැඩි ලෙස විරුද්ධත්වය පල කොට කොසෝවෝවට පුලුල් ස්වාධීනත්වයක් ප්‍රදානය කිරීමට පමනක් සූදානම්ව සිටියි. සර්බියාවේ සාම්ප්‍රදායික මිත්‍ර පාක්ෂිකයා වන රුසියාව සර්බියාවට සහාය දෙයි.

කොසෝවෝහි තත්ත්වය සම්බන්ධයෙන් වසරක් තිස්සේ පැවති සාකච්ඡාවලින් අනතුරුව, කොසෝවෝහි නිදහසට තුඩු දෙන ජාත්‍යන්තරව අධීක්ෂනයට ලක් වන ක්‍රියා දාමයක් සැලකිල්ලට ගත් සැලැස්මක් පින්ලන්තයේ ජනාධිපති මාටි ආටිසාරි පෙබරවාරියේ දී යෝජනා කලේ ය. සර්බියාවෙන් සහ රුසියාවෙන් පමනක් නො ව චීනයෙන් සහ ස්පාඤ්ඤය, ග්‍රීසිය, ඉතාලිය, ස්ලෝවැකියාව, සයිප්‍රසය, රුමේනියාව සහ ඕස්ට්‍රියාව ඇතුලු යුරෝපා රටවල් ගනනාවකින් ද ඉදිරිපත් වූ ප්‍රශ්න කිරීම්වලට ආටිසාරි සැලැස්ම මුහුන පෑවේ ය.

දැන් බුෂ් රුසියාවට නිෂේධ බලය හිමි එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලයේ එකඟතාවෙන් තොරව ඒකපාර්ශ්වීයව කොසෝවෝවේ නිදහස පිලිගන්නා බවට තර්ජනය කරයි. කොසෝවෝව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය තුල ඉදිරිපත් කිරීමට අපේක්ෂිත යෝජනාව ස්ථිර කිරීම සඳහා දරන ප්‍රයත්නයන් අසාර්ථක වුව හොත් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ස්වාධීනව ක්‍රියා කරමින් රුසියාවේ නිෂේධ බලය මග හැරීමට එක්සත් ජනපදය සූදානම් බවට බුෂ් අඟවා සිටියේ ය.

කොසෝවෝව තුල ජීවත් වන සර්බ්වරුන්ගේ හා අනෙකුත් ජාතික සුලුතරයන්ගේ අනාගත තත්ත්වය (නේටෝ යුද්ධයෙන් පසුව බොහෝ දෙනාට පලා යාමට බල කෙරුනි) කුමක් ද යන්න තව මත් පැහැදිලි නොමැතිවීම යන කරුන මගින් මෙම ඇඟවුමේ ප්‍රකෝපකාරී ස්වභාවය අවධාරනය වේ. 1990 නන්වල දී, ජාතික සුලුතරයන්ගේ අයිතීන් ස්ථාපනය නොකල තතු යටතේ ම ජර්මානු සහ ඇමරිකානු ආන්ඩු හදිසියේ ම ක්‍රොඒෂියාවේ සහ බොස්නියා හර්සෙගොවිනාවේ ස්වාධීනත්වය පිලිගත් අතර, යුගෝස්ලාවියාව තුල දසදහස් සංඛ්‍යාත ජනයා මරුමුව හෙලූ ලේ වැකි ජනවාර්ගික ගැටුම් පුපුරා ගියේ ය. කොසෝවෝවේ ස්වාධීනත්වය සඳහා යොදන තල්ලුවක ප්‍රතිඵලය ද එබඳු ජනවාර්ගික යුද්ධයක් අලුතින් පුපුරා යාම විය හැකි ය -- කිසිදු ජාත්‍යන්තර නෛතික සම්බාධක පැනවීමකින් තොරව එය සිදු කල හොත් එවැන්නක හැකියාව ඊටත් වඩා වැඩි වනු ඇත.

එමෙන් ම එය පුපුරනසුලු විය හැකි ජාත්‍යන්තර පූර්වාදර්ශයක් ස්ථාපනය කරනු ද ඇත. බෙදුම්වාදී ප්‍රවනතාවන් සමග සටන් වැද සිටින යුරෝපා රාජ්‍යයන් සංශයවාදයත් අනතුරු ඇඟවීමත් එකිනෙක සංකලනය වූ හැඟීමකින් යුතුව ආටිසාරි සැලැස්ම සැලකිල්ලට ගන්නේ මේ නිසා ය.

ඇබ්කේසියා සහ දකුනු ඔසේෂියා යන කැරලිකාරී ජෝර්ජියානු ප්‍රාන්ත මෙන් ම මෝල්දාවියානු ට්‍රාන්ස්නිස්ට්‍රියාව ස්වාධීන රාජ්‍යයන් වශයෙන් පිලිගන්නා බවටත් කොසෝවෝව ස්වාධීන රාජ්‍යයක් ලෙස සර්බියාවෙන් වෙන් කල යුතු බවටත් රුසියාව යලි යලිත් තර්ජනය කොට තිබේ. ඉහත සඳහන් කල ප්‍රදේශ තුන ම රුසියාව සමග සමීප මිත්‍ර සබඳතා පවත්වයි. මෙම තත්ත්වය තුල ඇති විය හැකි ප්‍රතිඵලය විය හැක්කේ අලුත් ප්‍රාදේශීය ගැටුම් පැන නැගීම යි, එසේ නො වේ නම්, එක්සත් ජනපදය සමග දේශපාලනිකව සහ මිලිටරිමය වශයෙන් සමීපව බැඳී සිටින ජෝර්ජියාව සම්බන්ධයෙන් මොස්කෝව සහ වොෂින්ටනය අතර ඍජු සට්ටනයක් හට ගැනීම යි.

## පුටින් ලෝක වෙලඳ සංවිධානයට පහර දෙයි

තමන්ගේ ම වූ දේශපාලන ප්‍රහාරයකින් පුටින් ජී8 සමුලුවට ප්‍රතිචාර දක්වා තිබේ. ඉරිදා සාන්ත පීටර්ස්බර්ග් නුවර පැවති ව්‍යාපාරික සංසදයක දී ඔහු ලෝක වෙලඳ සංවිධානයට (ඩබ්ලිව්ටීඕ) සහ බටහිර රටවල් ආධිපත්‍යය දරන අනෙකුත් ජාත්‍යන්තර ආර්ථික සංවිධානවලට තියුනු අන්දමින් පහර දුන්නේ ය. ඒවා ධනවත් රටවල් කුඩා සංඛ්‍යාවක අවශ්‍යතාවන්ට පමනක් සේවය කරන "යල් පැන ගිය, නිර්ප්‍රජාතන්ත්‍රවාදී සහ අනම්‍ය" සංවිධාන බව ඔහු පැවසී ය.

පැන නැගෙමින් පවත්නා වෙලඳ පොලවල ආර්ථික අවශ්‍යතාවන්ට අනුග්‍රාහක වන විකල්ප සොයා යාමක් උදෙසා පුටින් කැඳවුමක් කලේ ය. ආරක්ෂනවාදය සම්බන්ධයෙන් සංවර්ධිත රටවලට චෝදනා කල ඔහු "නිදහස් වෙලඳාම පිලිබඳ යුරෝපාසියානු සංවිධානයක්" ගොඩ නැගිය යුතු යැයි නිර්දේශ කලේ ය. ගෝලීය මූල්‍ය වෙලඳ පොලවල "ව්‍යවහාර මුදල් වර්ග එකක් හෝ දෙකක්," එනම් ඩොලරය සහ යුරෝව ආධිපත්‍යය දරන්නේ යැයි සඳහන් කල ඔහු ඒවා විවේචනයට ලක් කලේ ය. "මේ අභියෝගයට පවතින්නේ එක් පිලිතුරක් පමන යිඃ එනම් විවිධ වර්ගයේ ලෝක ව්‍යවහාර මුදල්, විවිධ වර්ගයේ මූල්‍ය මධ්‍යස්ථාන නිර්මානය කිරීම යි," ඔහු කියා සිටියේ ය.

පුටින්ගේ අනුප්‍රාප්තිකයා වීමට ඉඩ ඇතැයි සැලකෙන රුසියානු නියෝජ්‍ය අගමැති සර්ගෙයි ඉවානොව් රුසියානු ආර්ථිකය විවිධාංගීකරනය කිරීමක් පිලිබඳව නිවේදනය කලේ ය. තම රට 2020 වන විට, න්‍යෂ්ටික ශක්තිය, ගුවන් සහ අභ්‍යවකාශ ගමන්, නැව් ඉදි කිරීමේ කර්මාන්තය, මෘදුකාංග සහ නැනෝ තාක්ෂනය යන අංශවල සිදු කෙරෙන ලෝක පරිමාන නිෂ්පාදනයෙන් සියයට දහයකට ආසන්න ප්‍රමානයක පාලනය හිමි කර ගනු ඇති බවත් විශාලතම කාර්මික රටවල් පහෙන් එකක් ලෙස ස්ථාපනය වනු ඇති බවත් ඔහු පැවසී ය.

පුටින් සහ ඉවානොව් මේ කතා පැවැත්වූයේ කලින් පැවති සෝවියට් සමූහාන්ඩු එකොලහක එකමුතුවක් වන ස්වාධීන රාජ්‍යවල පොදු රාජ්‍ය මන්ඩලයෙන් (සීඅයිඑස්) පැමිනි දේශපාලනික සහ ව්‍යාපාරික නියෝජිතයන් 6,000ක් ඉදිරියේ ය. සීමන්ස්,

මෝටරෝලා, කොනොකෝෆිලිප්ස්, පෙප්සිකෝ සහ චීන සමාගමක් වන සිනොපෙක්හි ප්‍රධාන විධායකයන් ද ඇතුලු ජාත්‍යන්තර සමාගම්වලින් පැමිනි නිලධරයෝ ද මීට සහභාගි වී සිටියහ. ලෝක බැංකුවේ හිටපු ප්‍රධානයෙකු වන ජේම්ස් වොල්ෆෙන්ෂොන් සහ ජර්මනියේ හිටපු චාන්සලර් ගෙර්හාඩ් ෂ්රෝඩර් ද කථිකයන් අතරට ඇතුලත් වූහ. රුසියාවේ ආර්ථික සහ දේශපාලනික ශක්තිය යුරෝපයට යහපතක් වූ බව කියා සිටි ෂ්රෝඩර් එය වග වර්නනා කලේ ය.

සමුලුවේ ඉලක්කය වූයේ රුසියාව ආයෝජකයන් සඳහා ආකර්ෂනීය වෙලඳ පොලක් පිරිනමන විවෘත රටක් ය යන්න ගෙන හැර පෑම යි. සංසදය අතරතුර දී මහා පරිමානයේ කොන්ත්‍රාත්තු කීපයකට ම අත්සන් තැබුනි. සුසුකි, පීඑස්ඒ පර්ජෝ සිට්‍රෝන් සහ වොල්වෝ යන සමාගම් මෝටර් රථ කර්මාන්ත ශාලා ඉදි කිරීමට සම්බන්ධිතව කල ගනුදෙනුව මෙන් ම රුසියානු එයරොෆ්ලොට් සමාගම ඩොලර් බිලියන 3-4 දක්වා වූ වියදමක් දරා බෝයිං 787 වර්ගයේ ගුවන් යානා 22ක් මිල දී ගැනීමට සම්බන්ධිතව කල ගනුදෙනුව ද ඒ අතරට ඇතුලත් විය. හිටපු ලෝක චෙස් ශූරයෙකු වන ගැරී කැස්පරොව් විසින් නායකත්වය දෙන ලද විරෝධතාකරුවන් 3,000කින් පමන සමන්විත පිරිසකට සමුලුවෙන් පිටත සිට ඊට එරෙහිව විරෝධතා දැක්වීමට ඉඩ දෙන ලදි.

ලෝක වෙලඳ සංවිධානයට පුටින් එල්ල කල ප්‍රහාරය අලුතින් කාර්මීකරනය වෙමින් පවතින රටවල් සමග සමීප සහයෝගිතාවක් ඇති කර ගැනීම උදෙසා කල කැඳවුමක් යැයි අර්ථ දක්වා තිබුනි. *සුඩොයිෂ් සෙයිතුං* පුවත්පතට අනුව, "ව්ලැඩිමීර් පුටින්ට ලෝක බැංකුවෙන් තොර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් තොර, සහ ජී7 රටවල විශේෂයෙන් ඇමරිකාවේ පැත්තෙන් අඩු බලපෑමක් එල්ල වන නව ජාත්‍යන්තර ආර්ථික පද්ධතියක් අවශ්‍ය ය ... පීටර්ස්බර්ග්හි දී කල කතාවත් සමගින්, වඩ වඩාත් ආක්‍රමනකාරිත්වයක් ඉල්ලා සිටින - වැඩි දුරටත් කියන්නේ නම් ජාත්‍යන්තර ආයතන තුල දී වඩ වඩාත් ආක්‍රමනකාරිත්වයක් ඉල්ලා සිටින - අලුතින් කාර්මීකරනය වෙමින් පවතින රටවල ලැයිස්තුවට පුටින් සිය රට ද එක් කොට තිබේ."

ජී8 සමුලුවේ අවසන් දිනයට සහභාගි වන ලෙස චීනය, ඉන්දියාව, දකුනු අප්‍රිකාව, මෙක්සිකෝව සහ බ්‍රසීලය යන අලුතින් කාර්මීකරනය වෙමින් පවතින රටවලට ආරාධනා කොට තිබුනු මුත් ඔවුන්ට සැලකුවේ සත්තකින් ම නරක අන්දමිනි. ඔවුන්ගේ ආර්ථිකයන් අඩු සංවර්ධනයකින් යුක්ත වුව ද ඉහලින් කාර්මීකරනය වූ රටවල් හා සමානව දේශගුනය පාලනය කිරීමේ වැඩ පිලිවෙලවල් සඳහා දායක වන ලෙස ඔවුන්ට පීඩනය යොදන ලදි. ඔවුහු යෝජනාව ප්‍රතික්ෂේප කලහ.

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව යන විශේෂයෙන් දිලිඳු රටවල් කෙරෙහි බලපෑමක් එල්ල කරන රෝගවලට එරෙහිව සටන් කිරීම සඳහා මීලඟ වසර කීපය තුල දී ඩොලර් බිලියන 60කින් ආධාර කිරීම සඳහා සමුලුව දුන් තවත් ප්‍රතිඥාවක් සමීපව පිරික්සා බලන විට සනාථ වූයේ එය අත්‍යන්තයෙන් ම වංචනික ය යන්න යි. සහනාධාර සපයන සංවිධානවල ගනන් බැලීම්වලට අනුව, මෙම මුදල් ප්‍රමානය එක්කෝ සැපයීමට දිගු කලක් ගත වන පොරොන්දු මුදලකින් සමන්විත වන අතර, නැත් නම් සංවර්ධන ආධාර සඳහා වෙන් කල වෙනත් මුදල්වලින් අඩු කර ගැනීමට නියමිත ය. මෙම මුලු මුදල් ප්‍රමානයෙන් අලුත් මුදල් නියෝජනය වන්නේ මේ වන විට වසර කීපයක් තිස්සේ ම බෙදා හැර ඇති ඩොලර් බිලියන 3ක් වූ මුදලට සමාන මුදල් ප්‍රමානයක් පමනකි.

2008 සහ 2015 කාලය අතරතුර දී, අප්‍රිකාව තුල පැතිර පවතින බෝ වන රෝගවලට එරෙහිව සටන් කිරීම සඳහා අතිරේක වශයෙන් යුරෝ මිලියන 800ක් සපයන බවට ජර්මානු ආන්ඩුව පිලින දෙයි. එහෙත් හෙයිලිජෙන්ඩම්හි පැවැත්වූ සමුලුව සඳහා දැරූ මුලු වියදම යුරෝ මිලියන 100කි ය යන කරුන සැලකිල්ලට ගන්නා කල මෙය කනගාටුව ඇති කරන තරම් වූ සුලු සංඛ්‍යාවක් වේ.

## යුරෝපා උභතෝකෝටිකය

රුසියාව සමග හට ගෙන තිබෙන ඇටුම් ප්‍රජාතන්ත්‍රවාදය පිලිබඳව මතු වී ඇති මතභේදයන් යැයි ඇමරිකානු හා යුරෝපා පුවත්පත් සාමාන්‍යයෙන් ගෙන හැර පායි. රුසියාව ප්‍රජාතන්ත්‍රවාදී නැතැයි ඔවුහු කියා සිටිති.

අලුතින් ධනවත් වූ ඉහල පෙලැන්තියක අවශ්‍යතාවන් නියෝජනය කරන ව්ලැඩිමීර් පුටින්ගේ පාලන තන්ත්‍රයේ අනුකම්පා විරහිත සහ ඒකාධිපති ස්වරූපය සම්බන්ධයෙන් කිසිදු සැකයක් තිබිය නොහැකි ය. ඇමරිකානු සහ යුරෝපා ආන්ඩුවලින් ගලා එන ප්‍රජාතන්ත්‍රවාදය නැතිකම පිලිබඳ චෝදනාව අත්‍යන්තයෙන් ම නරුම සහගත ය.

බුෂ් ග්ඩාන්ස්ක් වෙත කල සංචාරයේ දී මෙය අතිශය පැහැදිලි ලෙස ප්‍රදර්ශනය විය. එහි දී ඔහු නිදහසේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ බලකොටුවක් ලෙස හඳුන්වමින් පෝලන්තය පමන ඉක්මවා වග වර්නනා කලේ ය. සැබවින් ම, කසින්ස්කි සොහොයුරන් නායකත්වය දෙන පාලන තන්ත්‍රයේ ඒකාධිපතිවාදී සහ ප්‍රතිගාමී අදහස් උදහස් චිරප්‍රකට ය. පෝලන්තයේ අධ්‍යාපන ඇමතිවරයා වන පෝලන්ත පවුල්වල (නායක)-කතෝලික සංගමයෙන් පැමිනියෙකු වන රෝමන් ගියෙර්ටිච් මේ වන විට පෝලන්ත පාසල් පොත්වලින් කෆ්කා, ර්තේ සහ ලෝක සාහිත්‍යයේ අනෙකුත් නියෝජිතයන්

වාරනය කොට තැබීමේ වැඩ කටයුතුවල යෙදී සිටියි. දක්ෂිනාංශික, ආධානග්‍රාහී පෝලන්ත ජාතිකවාදීන් ඔවුන්ගේ තැන ගැනීමට නියමිත ය.

"ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම සඳහා අවශ්‍ය කරන ආයතන සම්බන්ධයෙන් බැරෑරුම්ව වැඩ කටයුතුවල යෙදී සිටින" රටක් ලෙස ද බුෂ් ඇල්බේනියාව වග වර්නනා කලේ ය. එහෙත් *ෆ්‍රැන්ක්ෆර්ටර් ඕල්ජෙමෙයිනේ සෙයිතුං* නමැති කොන්සර්වැටිව් පුවත්පත පවා ඊට වඩා විවේචනාත්මක වූ අදහසක් පල කලේ ය. දැවැන්ත සීමා කිරීමකින් යුක්තව අදහස් දක්වමින් පුවත්පත ප්‍රකාශ කලේ, "ඇමරිකානුවන් යුරෝපානුවන් මෙන්, ප්‍රතිසංස්කරනයන් සඳහා නීරස ඉල්ලීම් ඉදිරිපත් කරමින් ටිරානාහි දේශපාලන ප්‍රභූවේ වැඩ කටයුතු වලට ද  ධනය යලි බෙදා හැරීම පිලිබඳව කෙරෙන ඔවුන්ගේ අරගලයයන් තුලට ද නිරන්තරයෙන් කඩා නොවදින්නේ ය යන" කරුන මත ඇල්බේනියාව තුල බුෂ්ට හිමිව ඇති ජනකාන්ත භාවය රඳා පවත්නා බව යි. *ෆ්‍රැන්ක්ෆර්ටර් ඕල්ජෙමෙයිනේ සෙයිතුං* පුවත්පත සඳහන් කරන්නේ, රට තුල සිටින සංවිධානගත මැර කල්ලි අතර පවතින දූෂනය සහ සතුරුකම් කොටු කර තැබීම යන්න මගින් "යලි බෙදා හැරීම පිලිබඳව වූ අරගල" යන්න වඩාත් නිවැරදිව විස්තර කෙරෙන බව යි.

බුෂ් නැගෙනහිර යුරෝපය තුල තැනින් තැන නතර වෙමින් කල හමු වීම් ද සාන්ත පීටර්ස්බර්ග්හි දී පුටින් කල කතාව ද එක්සත් ජනපදය හා රුසියාව අතර පවතින මතභේදවල සැබෑ අන්තර්ගතය කුමක් ද යන්න මනාව පැහැදිලි කලේ ය: ඒවා නම් ආර්ථික සහ මූලෝපායික අවශ්‍යතාවන් ය.

යුරෝපයට මෙම මතභේද අභිමුඛ වන්නේ උභතෝකෝටිකයක් සමගිනි. ජර්මානු චාන්සලර් ඇන්ජෙලා මර්කල් සහ නව ප්‍රන්ස ජනාධිපති නිකොලස් සර්කොසි තමන්ගේ පූර්වප්‍රාප්තිකයන් වූ ගෙර්හාඩ් ෂ්රෝඩර්ට සහ ජැක් චිරාක්ට වඩා එක්සත් ජනපද ගැති පිලිවෙතක් නියෝජනය කරති. එහෙත් බර්ලිනය සහ පැරිසිය යන දෙක ම වොෂින්ටනය මත ඕනෑවට වැඩියෙන් රඳා නොපැවතීමට පරිස්සම් වෙයි. ඔවුන්ට රුසියාව සමග හොඳ සම්බන්ධයක් අවශ්‍ය ය. විශේෂයෙන් ම එය ජර්මනිය සමග සමීප වෙලඳ සබඳතා පවත්වා ගෙන යන අතර ජර්මනිය එහි බලශක්ති සැපයුම කෙරෙහි විශ්වාසය තබා සිටී.

එක්සත් ජනපදය සහ රුසියාව අතර ගැටුම මෙය වඩ වඩාත් දුෂ්කර තත්ත්වයට පත් කරයි. එය යුරෝපයට පැති ගැනීමට බල කරන අතර මහාද්වීපය තුල බෙදීම් ඇති කරයි. ඒ අනුව, තමන්ගේ අධිරාජ්‍යවාදී අවශ්‍යතාවන් තහවුරු කර ගැනීමේ පහසු මගක් ලෙස ජර්මනියේ සහ වෙනත් යුරෝපා බලවතුන්ගේ සැලකිල්ලට ලක්ව ඇති එක්සත් ජාතීන්ගේ සංවිධානය බඳු ජාත්‍යන්තර ආයතනවල කාර්ය භාරය ශක්තිමත් කිරීමට උත්සාහ දරන අතරවාරයේ දී ම බුෂ් සහ පුටින් අතර ගැටුමට සිසිල් පැන් පොදක් ඉසිනු පිනිස ජී8 සමුලුවේ දී ජර්මානු චාන්සලර්වරිය යම් දුරක් පෙරට යා ය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රාමුව තුල දේශගුනය පිලිබඳ විසුමක් පිලිගැනීමට එක්සත් ජනපදය තල්ලු කර ගැනීමේ දී ඇය සාර්ථකත්වය අත් කර ගත්තේ ය යන කරුන ප්‍රධාන ජයග්‍රහනයක් ලෙස හුවා දක්වමින් ජර්මානු පුවත්පත් සිය ආචාරය පිරිනැමී ය.

එබඳු ව්‍යවස්ථාවක් 2050 වසර තෙක් පවතියි. එහෙත් ඒ අතරවාරයේ, වසර පනහක් තබා පහලොවක් වත් එක්සත් ජාතීන්ගේ සංවිධානය පවතිනු ඇත් ද යන්න සැක සහිත ය. මහා බලයන් අතර ආතතීන් වැඩෙමින් පවතින තතු යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානය තමන් තම පූර්වප්‍රාප්තිකයා වන ජාතීන්ගේ සංගමය මෙන් ම නිරර්ථක හා වැදගැම්මකට නැති දෙයක් බව සනාථ කරමින් සිටියි. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ දී පල කරන තනි ඡන්දයක් මගින් ස්වාධීනව කොසෝවෝව පිලිගැනීමට බුෂ් කරන තර්ජනය වනාහි මෙම ආයතනයේ මලගම පතා වදින තවත් මරු පහරක් පමනකි.

© www.wsws.org